සමගි ජන බලවේගය
ஐக்கிய மக்கள் சக்தி • Samagi Jana Balawegaya

අංක 592, බංගලා හන්දිය,
කෝට්ටේ පාර, පිටකෝට්ටේ.
0112 870 211
0112 870 212
info@sjb.lk

2023.06.19

**සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීමේදී අද ගනු ලැබූ තීන්දුව!**

අත්තනෝමතික ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කිරීම හේතුකොටගෙන ඔවුන් විසින් ගෙන එනු ලැබූ සියලු යෝජනා වලට කොන්දේසි විරහිතව එකඟ වීමට ආණ්ඩුවට සිදුව ඇති අතර මෙය හුදෙක් ආණ්ඩුවේ දුර්වල සහ අමනොඥ බවේ ප්‍රතිඵලයක් බව සමගි ජන බලවේගය බලවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම අද (19) අවධාරණය කරනු ලැබීය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කටයුතු කළ යුතු බව මුල සිටම සමගි ජන බලවේගය දැරූ ස්ථාවරය වූ අතර අද ද එම ස්ථාවරයේ කිසිදු වෙනසක් නැත. එහෙත් ඒ ගනුදෙනුව සිදු කළ යුත්තේ විනිවිද භාවයකින් සහ රටට ජයග්‍රහණ අත්පත් කරගත හැකි වාසිදායක තත්ත්වයක් නිර්මාණය කර ගැනීමෙන් බව සමගි ජන බලවේගයේ ඒකමතික ස්ථාවරය විය.

එසේම පුන පුනාම විපක්ෂයක් ලෙස සමගි ජන බලවේගය විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ රජය ඇති කර ගත් ගිවිසුමට අදාළ දත්ත සහ ලේඛන පාර්ලිමේන්තුවේ සභාගත කරන ලෙස ඉල්ලා සිටියද එවැන්නක් සිදු නොවූ බවත් එම දත්ත රටෙන්, පාර්ලිමේන්තුවෙන් සඟවා තැබූ හේතුවෙන් ලබාගත හැකිව තිබූ ප්‍රගතිශීලී ජයග්‍රහණ රටට අහිමි වී ගිය බවත් මන්ත්‍රී කණ්ඩායමේ ස්ථාවරය විය.

විශේෂයෙන්ම විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ගිවිසුම් ක්‍රියාත්මක කළ හැකි වුවත් මහබැංකු අධිපති හා මුදල් රාජ්‍ය ඇමති විසින් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු නොකරන බව පවසා සිටියදීත් ජනාධිපතිවරයා විසින් දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කරන බව පැවසීම පුදුමයට කරුණකි. මේ දෙබිඩි පිළිවෙත හේතුකොට ගෙන එක් අතකින් ජාත්‍යන්තරය ඉදිරියේ රට විහිළුවටත්, දේශීය වශයෙන් රට ප්‍රපාතයකටත් තල්ලු වීමේ බරපතළ අනතුරක් පැන නැගී ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ගනුදෙනු කළ බංකොලොත්ව තිබූ රටවල් රැසක්ම විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට පමණක් එකග වූ බව ආණ්ඩුව නොදන්නේද? නැතිනම් දැන දැනම සිය අමනෝඥ භාවය හේතු කොටගෙන දේශීය සහ විදේශීය දෙකෙහිම ණය ප්‍රතිව්‍යුහගතකරණයට එකඟ වූවා ද?

එබැවින් අවස්ථාවෙන් අවස්ථාවට දෙබිඩි පිළිවෙත් අනුගමනය කරමින් අසත්‍යයට සහ අවස්ථාවාදීත්වයට මුල්තැන දෙමින් කටයුතු කරන ආණ්ඩුවේ මේ ගිවිසුමට සමගි ජන බලවේගය විරුද්ධ වීමට තීරණය කරනු ලැබීය!

මාධ්‍ය අංශය
සමගි ජන බලවේගය